**ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාව - 2023**

**--------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2023 දෙසැම්බර් 31 දිනට ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක්

නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදු වන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, මෙම වාර්තාවේ 1.6.1 (ඇ) නිරීක්ෂණය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශය ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බිල්කළ යුතු මුද්දර ගාස්තු ආදායම රු.1,266,500 ක් හා ස්ථාවර තැන්පතු පොළී ආදායම රු.275,874 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | මුද්දර ගාස්තු 2024 වර්ෂයේදී උපලේඛන අනුව බිල්කිරීම් කරන බව හා පොළිය නිවැරදි කිරීමට කටයුතු කරන බව | ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් දායක අරමුදලට ගෙවිය යුතු රු.869,602 ක් සඳහා ණයහිමි ප්‍රතිපාදන වෙන් කර නොතිබුණි. | 2024 වර්ෂයේදී ණයහිමි ප්‍රතිපාදන ඇති කරන බව. | ගෙවිය යුතු වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයෙහි නල ළිඳ ඉදිකිරීම සඳහා වැයකර තිබූ රු.715,875 ක ප්‍රාග්ධන වියදම ඉඩම් හා ගොඩනැගිලි යටතේ ගිණුම්ගත නොකර යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ යටතේ ගිණුම්ගත කර තිබුණි. | 2024 වර්ෂයේදී නිවැරදි කරන බව. | වියදම් නිවැරදිව හඳුනාගෙන ප්‍රාග්ධනිත කළ යුතුය. |
| (ඈ) | 2021 දෙසැම්බර් 31 දිනට ප්‍රධාන ලෙජරයේ පවත්වා ගෙන ගොස් තිබූ සමුච්චිත අරමුදල් ගිණුමේ ශේෂය රු.411,213 ක් වැඩියෙන් දක්වා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේදීද එය නිවැරදි කිරීමට කටයුතු නොකර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණි. | 2021 වර්ෂයේදී ලෙජරය සකස් කිරීමේදී මෙම වරද සිදුවී ඇති බව. | සමුච්චිත අරමුදල් ගිණුමේ ශේෂය නිවැරදි කර ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) | එකතු වටිනාකම රු.354,009 ක් වූ තොග අයිතම 22 ක් ලී බඩු හා උපකරණ යටතේ ගිණුම්ගත කර තිබූ අතර රු.9,800 ක් වූ විල්බැරෝව ලී බඩු හා උපකරණ යටතේ සහ කර්මාන්ත උපකරණ යටතේ දෙවරක් ගිණුම්ගත කර තිබුණි. | 2024 වර්ෂයේදී ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කරන බව. | වත්කම්වල වටිනාකම නිවැරදිව වර්ගීකරණය කර නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඊ) | 2024 වර්ෂය වෙනුවෙන් දරන ලද රු.139,026 ක වියදම් පෙර ගෙවුම් ලෙස ගිණුම්ගත නොකර සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | 2024 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වර්ෂයට අදාළ වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (උ) | ස්ථාවර තැන්පතු 03 ක් සඳහා ලැබිය යුතු රු.138,189 ක පොලී ආදායම ගිණුම්ගත කර නොතිබුණි. | 2024 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වර්ෂයට අදාළ පොළී ආදායම නිවැරදිව ගණනය කර ගිණුම්ගත කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ134 (1) වගන්තිය | සභාව විසින් 2015 වර්ෂයේදී හඳුනාගත් දියුණු කළ ප්‍රදේශ වලින් වරිපනම් බදු අයකිරීමට සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් කටයුතු කර නොතිබුණි. | 2024 වර්ෂයේදී දියුණු කළ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත්කළ එක් වසමකින් වරිපනම් බදු රු.16,554 ක් අයකළ බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 (ඒ) වගන්තිය | යම් ආගමික, පුණ්‍ය, සංස්කෘතික, සෞඛ්‍ය විනෝදාත්මක හෝ අධ්‍යාපනික කාර්යයක් සම්බන්ධයෙන් එක් වර්ෂයකට මුලු එකතුව රුපියල් එක් දහසක් නොඉක්මවන වියදම් සඳහා අමාත්‍යවරයාගේ ලිඛිත පූර්ව අනුමැතිය ලබාගත යුතු වුවත්, ගීත රසාස්වාද වැඩසටහන පැවැත්වීම සඳහා වැයකළ රු.73,885 කට අදාළව එපරිදි අනුමැතිය ලබාගෙන නොතිබුණි. | ඉදිරියේදී මෙවැනි අඩුපාඩු සිදු නොවීමට කටයුතු කරන බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 260(1) | සමාලෝචිත වර්ෂයේදී විවිධ කාර්යයන් 3 ක් සඳහා ගෙවීම් කිරීමේදී නියමිත ආදායකට ගෙවීම් කිරීමට කටයුතු නොකර සභා ලේකම් නමින් රු.176,360 ක චෙක්පත් ලියා මුදල් ලබාගෙන තිබුණි. | ඉදිරියේදී මෙවැනි අඩුපාඩු සිදුනොවීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම රු.3,823,315 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.910,950 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 1,054,000 | 709,120 | 736,720 | 127,160 | 530,000 | 692,800 | 635,120 | 154,760 |
| කුලී | 8,971,000 | 4,004,296 | 4,618,578 | 772,014 | 6,045,000 | 3,377,183 | 3,462,646 | 1,386,296 |
| බලපත්‍ර ගාස්තු | 1,685,700 | 1,833,050 | 2,364,900 | 863,490 | 1,348,200 | 1,720,235 | 1,790,685 | 1,395,340 |
| වෙනත් ආදායම් | 3,686,500 | 1,239,604 | 1,653,867 | 214,345 | 2,110,000 | 1,682,430 | 1,170,193 | 628,608 |
| **එකතුව** | **15,397,200** | **7,786,070** | **9,374,065** | **1,977,009** | **10,033,200** | **7,472,648** | **7,058,644** | **3,565,004** |

### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ව්‍යාපාර ඒකක 94 කින් ලැබිය යුතු ව්‍යාපාර බදු රු.127,160 ක් 2022 නොවැම්බර් 04 දිනැති අංක 2305 දරණ ගැසට් නිවේදනය අනුව 2023 මාර්තු 31 දින වන විට අයකළ යුතු වුවත්, එපරිදි කටයුතු කර නොතිබූ අතර හිඟහිටි ශේෂය තුළ ඉකුත් වර්ෂයන්ට අදාළ හිඟය රු.117,800 ක් විය. | රු.5,400 ක් අයකර ගෙන රු.6,360 ක් සඳහා නඩු පවරා ඇති බවත්, ඉතිරි හිඟය අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාව සතු කඩ කාමර 14 කින් ලැබිය යුතු කඩ කුලී රු.104,200 ක් අයකර ගැනීමට ප්‍රාදේශීය සභා පනතේ 159(1) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | රු.94,000 ක් අයකර ගෙන ඇති අතර ඉතිරි හිඟය අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය. |
| (ඇ) | සභාවට අයත් වාහන හා යන්ත්‍රෝපකරණ ඉකුත් වර්ෂවලදී හා සමාලෝචිත වර්ෂයේදී මුදල් අය නොකර ණය පදනම මත ලබාදීම නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ශේෂය රු.218,700 ක් විය. | රු.34,850 ක් අයකර ගෙන ඇති අතර 2021 වර්ෂයේ හිඟය වූ රු.129,650 අයකර ගැනීම සඳහා අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාව සතු දේපල 04 කට අදාළව ලැබිය යුතු වෙළඳ අයිතිය බදු දීමේ කුලී රු.345,778 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | රු.30,000 ක් අයකර ගෙන ඇති අතර ඉතිරි හිඟ මුදල් අයකර ගැනීමට අධිකරණ ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ව්‍යාපාර ඒකක 135 කින් ලැබිය යුතු රු.120,000 ක් වූ වෙළඳ බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබූ අතර ප්‍රාදේශීය සභා පනතේ 122(2) වගන්තිය ප්‍රකාරව නඩු පැවරීමට සභාව කටයුතු කර නොතිබුණි. | රු.3,000 ක් අයකර ගෙන රු.7,500 ක් සඳහා නඩු පවරා ඇති අතර ඉතිරි හිඟය අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය. |
| (ඊ) | සභා බල ප්‍රදේශයේ ප්‍රදර්ශනය කර තිබූ දැන්වීම් පුවරු වලින් කාලීනව ගාස්තු අයවී නොතිබූ අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ආයතන 26 කින් ලැබිය යුතු දැන්වීම් පුවරු ගාස්තු රු.743,490 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | රු.52,000 ක් අයකර ගෙන රු.460,090 ක් අයකර ගැනීම සඳහා අධිකරණ ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉදිකිරීම සඳහා අනුමත කර තිබූ වාණිජ්‍ය ගොඩනැගිලි සැලසුම් 03 ක අනුමත ප්‍රමාණය ඉක්මවා ඉදිකළ වර්ගමීටර් ප්‍රමාණය සඳහා ආවරණ අනුමැතිය ලබාදීමේ හා පෙරසැරි ගාස්තු සහ අනුකූලතා සහතික ගාස්තු පිළිවෙලින් රු.202,967 ක් හා රු.10,000 ක් අයකර ගෙන නොතිබුණි. | සංශෝධිත සැලසුම් ඉදිරිපත් කර අනුමත කර ගන්නා ලෙස ඉදිකිරීම්කරුවන් දැනුවත් කළ බව | නියමිත ගාස්තු අයකර සංශෝධිත සැලසුම් අනුමත කළ යුතුය. |
| (ආ) | ඉදිකිරීම් කටයුතු නිම නොකළ වලංගු කාලය ඉක්මවා ගොස් තිබූ වානිජ්‍ය ගොඩනැගිලි 11 කට අදාළ සැලසුම්වල කාලය දීර්ඝ කර රු.55,000 ක ගාස්තු හා අනුමත කරන ලද ගොඩනැගිලි සැලසුම් දෙකක් සහ මායිම් තාප්පයක් ඉදිකිරීමට අදාළව ඉදිකිරීම් කටයුතු නිමකර තිබුණද ඒවා පරීක්ෂා කර අනුකූලතා සහතික නිකුත් කර රු.15,000 ක ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සැලසුම් 06 ක කාලය මේ වන විට දීර්ඝ කර ඇති අතර අනෙකුත් සැලසුම් 05 හි කාලය දීර්ඝ කරගන්නා ලෙස අදාළ පුද්ගලයින් දැනුවත් කළ බව. | වලංගු කාලය දීර්ඝ කිරීමේ ගාස්තු හා අනුකූලතා සහතික ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 වර්ෂයේ ව්‍යාපාර සමීක්ෂණයෙන් හඳුනාගෙන තිබූ ව්‍යාපාර ඒකක 24 ක් සඳහා පරිසර බලපත්‍ර ලබා නොදීම නිසා සභාවට උපයාගත හැකිව තිබූ රු.105,600 ක ආදායමක් අහිමි වී තිබුණි. | පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාදීමට කටයුතු කරන බව. | ව්‍යාපාර ආයතන පරිසර බලපත්‍ර ලබාගැනීමට උනන්දු කළ යුතුය. |

## 3.3 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව සතු ඉඩම් 87 ක නීත්‍යානුකූල අයිතිය සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉඩම් පවරා ගැනීම් කටයුතු සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය තහවුරු කරගත යුතුය. |
| (ආ) | ඉකුත් වර්ෂයන්හිදී ධාවනයෙන් ඉවත් කළ වාහන 04 ක් අලුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ අපහරණය කිරීමට සභාව කටයුතු කර නොතිබුණි. | නිර්දේශ ලබා ගැනීම සඳහා විශේෂ සමීක්ෂණ මණ්ඩලයක් පත්කර ඇති අතර නිර්දේශ ලැබීමෙන් පසු ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බව. | වත්කම් අලුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.4 ව්‍යාපෘති, කතර්ව්‍යන් හෝ ප්‍රාග්ධන වැඩ ඉටු කිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 වර්ෂයේ අයවැය ලේඛනයේ ඇතුළත් එකතු වටිනාකම රු.1,300,000 ක් වූ සංවර්ධන යෝජනා 03 ක් සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. | සභාවේ ගිණුම්වල ප්‍රමාණවත් තරම් මුදල් නොතිබූ බැවින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බව. | අයවැය මගින් ප්‍රතිපාදන වෙන්කර ඇති සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කළ යුතුය. |

## 3.5 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය සහ 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 177 ප්‍රකාරව මිල ගණන් කැඳවීමකින් තොරව අවස්ථා 13 කදී එකතුව රු.572,355 ක් වූ භාණ්ඩ හා සේවා මිලදී ගැනීම් සිදුකර තිබුණි. | මෙවැනි අඩුපාඩු ඉදිරියේදී සිදු නොකිරීමට කටයුතු කරන බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන සහ රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3.6 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අකුරැස්ස නිවස අසළ තුන්මංසන්දියේ බෝක්කුව ප්‍රතිසංස්කරණය කිරීමේ කර්මාන්තයේ ඉදිකිරීමේ කටයුතු සඳහා ගෙවීම් කිරීමේදී මාර්ගය බොරළු පස් යොදා තලා සණවත් කිරීමේ කාර්යයන් වෙනුවෙන් රු.80,104 ක් සහ රු.10,623 ක ප්‍රමාද ගාස්තු ගණනය කර අයකර ගෙන නොතිබුණි. | වැඩිපුර ගෙවා ඇති මුදලින් රු.27,857 ක් අයකර ගන්නා බවත්, ප්‍රමාද ගාස්තු රැඳවුම් මුදලින් අයකර ගන්නා බව. | වැඩිපුර ගෙවා ඇති මුදල් සහ ප්‍රමාද ගාස්තු අයකළ යුතුය. |
| (ආ) | මුතුමාල මෝල ඉදිරිපිට මාර්ගයේ දකුණුපස දෙවන පටුමග මාර්ගයේ බෝක්කුව සැකසීමේ කර්මාන්තයට අදාළ ගෙවීම් වාර්තාවේ 1.2 වැඩ විෂයය යටතේ බෝක්කුව දෙපස පස් පුරවා තැලීම සහ මාර්ගය මීටර් 30 ක් දිගට පස් යොදා තලා සණවත් කිරීම වෙනුවෙන් රු.67,089 ක් වැඩිපුර ඇතුළත් කර තිබූ අතර රු.2,164 ක ප්‍රමාද ගාස්තු අයකර ගෙන නොතිබුණි. | වැඩිපුර ගෙවීම් රු.23,333 ක් සහ ප්‍රමාද ගාස්තු රු.2,164 ක් අයකර ගැනීමට කටයුතු කරන බව. | වැඩිපුර ගෙවීම් සහ ප්‍රමාද ගාස්තු නැවත අයකර ගත යුතුය. |
| (ඇ) | සභාව විසින් ක්‍රියාත්මක කර තිබූ කර්මාන්ත 02 කට අදාළව බෝක්කුව දෙපස පස් පුරවා තලා සණවත් කිරීම සහ මාර්ගය සංවර්ධනය කිරීම යන කාර්යය සඳහා නිවැරදි මිල ගණන් යොදා නොගෙන ඇස්තමේන්තු සකස් කර ගෙවීම් කිරීම සඳහා බිල්පත් සකස් කර තිබීම නිසා රු.73,088 ක් වැඩිපුර බිල්කර තිබුණි. | වැඩිපුර ගෙවීම් කළ රු.20,818 ක් අයකර ගන්නා බව. | වැඩිපුර ගෙවා ඇති මුදල් නැවත අයකර ගත යුතුය. |

## 3.7 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ අනුමත හා තථ්‍ය කාර්යය මණ්ඩලය පිළිවෙලින් 45 ක් හා 55 ක් වූයෙන් තනතුරු 06 කට අදාළ අතිරික්තතා 14 ක් විධිමත් කර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය වනවිටත් කටයුතු කර නොතිබුණි. | අතිරික්ත තනතුරු අනුමත කර ගැනීමට ඉල්ලුම් කළ නමුත් අනුමැතිය නොලැබුණු බව. | කාර්ය මණ්ඩලයේ අතිරික්තතා විධිමත් කර ගැනීමට කටයුතු කළ යුතුය. |